උඩුනුවර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ජූලි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ඔක්තෝබර් 18 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝබර් 21 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2018 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 3/81 අය ශීර්ෂයට, සමාලෝචිත වර්ෂයේ ආදායම රු.425,240 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී, නළ ළිං වටිනාකම රු.1,741,000 කින් වැඩියෙන් පෙන්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (ඇ) | ස්ථාවර වත්කම් ගිණුම හා උපලේඛන සම කිරීම වෙනුවෙන් රු.250,000 ක වටිනාකමක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් අවිනිශ්චිත ගිණුමට මාරු කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දී, මිල දී ගත් රු.1,521,343 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (ඉ) | වරිපනම් මෘදුකාංගයෙහි සහ ගිණුමෙහි ආරම්භක ශේෂ නොගැළපීම නිවැරදි කිරීමේ දී, රු.818,827 ක් වැඩියෙන් ගළපා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (ඊ) | නිවැරදිව සනාථ කර ගැනීමකින් හා විධිමත් අනුමැතියකින් තොරව ආරම්භක ශේෂ නිවැරදි කිරීම සඳහා | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | සමුච්චිත අරමුදලට ගැලපීමට අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | රු.45,998,433 ක වටිනාකමක් සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි. | | |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට කර්මාන්ත ණයහිමියන් සහ වියදම (වැය අංක 304) රු.431,312 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (ඌ) | සභා අරමුදල් කර්මාන්ත සහ බාහිර ප්‍රතිපාදන කර්මාන්ත වෙනුවෙන් වර්ෂය තුළ වැය කළ මුදල දෙවරක් වැයගත කිරීම හේතුවෙන්, සමස්ත වියදම රු.5,195,624 කින් වැඩිපුර දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (එ) | කර්මාන්ත ණයහිමි ගෙවීම් රු.1,209,554 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| (ඒ) | 2014 හා 2015 වර්ෂවල ලැබී තිබුණු 2014 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු රු.7,417,360 ක් තවදුරටත් ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස ණයගැතියන් යටතේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී නිවැරදි කරමි. |

1.3.2 <u>නොසැසඳුණු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 03 ක ශේෂය උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී, රු.16,180,842 ක නොසැසඳීමක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.8,995,776 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම් ශේෂය කඩිනමින් නිරවුල් කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) <u>ලැබිය යුතු ගිණුම්</u> | | |
| අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.9,693,432 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.59,802,918 ක් විය. | අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ලැබිය යුතු මුදලින් කොටසක් අය වී ඇති අතර, ඉතිරි මුදල් 2019 වර්ෂයේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u> අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,265,588 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |

1.3.5 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>
<u>තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් ලේඛන, ලිපිගොනු, උපලේඛන, ලදුපත්, තොග ලේඛන හා ණයහිමි ලේඛන ආදිය ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.189,699,834 ක් වූ ගිණුම් විෂයයන් 16 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ලේඛන යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) ගිණුම් විෂයයන් 22 ක ආරම්භක ශේෂවල පැවති රු.123,659,729 ක නොසැසඳීම් නිරවුල් නොකිරීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල 2018 ජනවාරි 01 දිනට වූ ශේෂවල නිවැරදිතාවය විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය. | ආරම්භක ශේෂ නිවැරදිව ගලපා නිරවුල් කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී නිවැරදි කරමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

නීති, රීති, රෙගුලාසී හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | සභාවට අයත් සියලුම මාර්ග විස්තර සඳහන් කර ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය නිවැරදිව පවත්වා ගෙන යා යුතු වේ. | යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| (i) | 59 හා 67 රීති | සභා බල ප්‍රදේශය තුළ ඇති කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීය බදු, ඩිජිටල් කුළුණු සහ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීති අනුව ක්‍රියා කළ යුතු වේ. | සමීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. |
| (ii) | 218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර, ස්ථාවර වත්කම් ලේඛන ද නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. | අදාළ රීති අනුව, සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදු කළ යුතු වේ. | සමීක්ෂණ හා යාවත්කාලීන කිරීම් කටයුතු ආරම්භ කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | අදාළ ක්‍රියාමාර්ග නොගෙන තැන්පතු 223 ක් අවුරුදු 29 ක කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි අනුව, කටයුතු කළ යුතු වේ. | සභා අනුමැතියක් යටතේ මහා සභා අරමුදලට බැර කිරීමට තීරණය කර ඇත. |
| (ඈ) | 1952 අංක 06 දරන සම්මත අතුරු ව්‍යවස්ථාවේ II වන කොටසේ විධිවිධාන | දැන්වීම් පුවරු සම්බන්ධ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කර දැන්වීම් ගාස්තු අය කළ යුතු වේ. | වර්තමානයේ අය කිරීම් සිදු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | වෙනත් චක්‍රලේඛ | | | |
| (i) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සටහන් කිරිමට ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |
| (ii) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 04 වගන්තිය | කඩ කාමර 04 ක තක්සේරු පදනමකින් තොරව කුලි අය කරමින් පැවතුණි. | තක්සේරු පදනමක් යටතේ කුලි අය කළ යුතු වේ. | දේපළ ගැටළු පවතින බැවින්, ඉදිරියේ දී විසඳා ගැනීමට කටයුතු කරමි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,372,964 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,190,418 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **(i)** | වරිපනම් හා බදු | 8,880,000 | 11,556,050 | 6,178,196 | 22,363,307 | 6,770,000 | 12,484,060 | 6,276,425 | 17,044,620 |
| **(ii)** | කුලී | 1,672,680 | 931,070 | 829,920 | 291,031 | 1,473,000 | 1,280,180 | 1,205,740 | 800,262 |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | 1,501,000 | 1,314,062 | 1,314,062 | -- | 1,301,000 | 1,411,600 | 1,411,600 | -- |
| **(iv)** | වෙනත් ආදායම් | 33,424,662 | 37,161,240 | 7,699,180 | 69,340,774 | 29,000,000 | 32,857,590 | 38,963,237 | 15,584,440 |
| | එකතුව | 45,478,342 | 50,962,422 | 16,021,358 | 91,995,112 | 38,544,000 | 48,033,430 | 47,857,002 | 33,429,322 |

2.2.2 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.21,089,061 ක වරිපනම් ශේෂයක් අය කර ගත යුතුව පැවතුණි. | අය විය යුතු වරිපනම් අය කළ යුතු වේ. | හිඟ හිටි ශේෂ අය කිරීමට කටයුතු කරමි. |

(ආ) අක්කර බදු

| | | |
|---|---|---|
| ------------- | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.245,796 ක ශේෂයක් අය කර නොතිබුණි. | ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,485,752 ක් හා මුද්දර ගාස්තු රු.66,844,522 ක් විය. | ලැබිය යුතු ගාස්තු අය කිරීමට අදාළ කටයුතු සිදු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් කසළ ව්‍යාපෘති සඳහා කසළ අංගනයේ පෙරහන් මාධ්‍ය සැකසීමට රු.300,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත්, එම කාර්යය ඉටු කර නොතිබුණි. | නිවැරදි ශක්‍යතා අධ්‍යයනයක් මඟින් ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතු වේ. | මහජන විරෝධතා නිසා, අපේක්ෂිත කාර්යය ඉටු කිරීමට නොහැකි වුණි. |

(ආ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා පරිසර බලපත්‍රයක් ලබා නොගෙන කිරිවවුල කසළ අංගනය වෙත අපද්‍රව්‍ය බැහැර කරමින් තිබුණි. | අපද්‍රව්‍ය බැහැර කිරීම නිවැරදිව කළ යුතු වේ. | මේ සඳහා ප්‍රාදේශීය ලේකම් සමඟ සම්බන්ධ වී අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට හැකි වන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව සැලසුම් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2011 සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම් එකතු කිරීමේ දී, සිදු වී තිබූ මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික හා අවසන් පරීක්ෂාවේ දී, හඳුනා ගත් රු.1,028,451 ක ශේෂයක් අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව, අදාළ පරීක්ෂණ පවත්වා ක්‍රියාමාර්ග ගත යුතු වේ. | හිඟ හිටි ශේෂ අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය පරිදි කටයුතු නොකර, සභාව විසින් දවුලගල පුස්තකාලය අසල සති පොල 2014 වර්ෂයෙන් පසුව වසා දමා තිබුණි. | පනත අනුව, පොදු කටයුතු සිදු කළ යුතු වේ. | විගණන නිරීක්ෂණයන් සමඟ එකඟ වෙමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| | 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 14 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | සේවක කොටසක් බඳවා ගත් අතර, ඉදිරියේ දී අනෙක් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) සේවක ණය

--------------

| | | |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අය විය යුතු රු.154,184 ක සේවක ණය ශේෂයක් අය කර නොතිබුණි. | හිඟ සේවක ණය අය කළ යුතු වේ. | ලිපි මාර්ගයෙන් දැනුවත් කර ඇති අතර, අය කිරීම් ද සිදු කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව රු.112,461,100 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි පැවතිය ද, ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් අගය හඳුනා ගෙන නිවැරදිව ලේඛනගත කළ යුතු වේ. | සමීක්ෂණයක් සිදු කරන අතර, ඉදිරියේ දී ලේඛනගත කරමි. |

3.4.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.374,501 ක් වූ ජල නළ උපාංග අයිතම 2235 ක් වසර 10 කට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ජල ගබඩාවේ පැවතුණි. | වත්කම් නිෂ්ක්‍රීය වීමට ඉඩ නොහැරිය යුතු වේ. | අවශ්‍ය අවස්ථාවන් හිදි අලුත්වැඩියා කටයුතු සඳහා ජල නළ උපාංග භාවිතා කිරීමට ගබඩා කර ඇත. |
| (ආ) | වටිනාකම රු.5,121,000 ක් වූ වත්කම් අයිතම 10 ක් වසර 01 ත් 06 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම සිදු කළ යුතු වේ. | වෙන්දේසි කළ යුතු වත්කම් ඉදිරියේ දී වෙන්දේසි කරමි. |
| (ඇ) | කාර් රථයක් දිරාපත් වන ආකාරයට සභා භූමිය තුළ ගාල් කර තිබුණි. | වත්කම්වලින් ප්‍රයෝජන ගත යුතු වේ. | මෙය ප්‍රධාන ලේකම් කාර්යාලයට භාර දීමට කටයුතු සුදානම් කර ඇත. |

3.4.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 200 අනුව, සභාව සතු කොස්හින්න ආදාහනාගාරයේ ඇති උපකරණ අයිතිම 25 ක් හා කිරිවවුල කොම්පෝස්ට් අංගනයේ ඇති උපකරණ අයිතම 18 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | අදාළ රීති අනුව, නිවැරදිව ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කරමි. |

| | | |
|---|---|---|
| (ආ) 2014, 2015 හා 2016 යන වර්ෂවල සමීක්ෂණය මගින් අපහරණය සඳහා නිර්දේශ කර තිබූ භාණ්ඩ අපහරණය කර නොතිබුණි. | අපහරණයට නිර්දේශ වූ භාණ්ඩ ඉවත් කළ යුතු වේ. | අපහරණ මණ්ඩලයක් පත් කර, ඉදිරියේ දී, මෙම භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) 2018 වර්ෂයට අදාළව සිදු කර තිබූ පුස්තකාල පොත් සමීක්ෂණය අනුව, පරීක්ෂාවට ඉදිරිපත් වී නොවූ රු.43,065 ක් වටිනා පොත් 201 ක් සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඌන පොත් සම්බන්ධව අදාළ පරිදි කටයුතු කළ යුතු වේ. | වාර්තාවක් ලබා දෙන ලෙස පුස්තකාලාධිපතිනියන් පස්දෙනා වෙත දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කර අයකර ගැනීම් කටයුතු සිදු කරමි. |

3.4.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1995, 2014 සහ 2015 වර්ෂවල දී ලැබී තිබුණු රු.36,615,296 ක් වටිනා වාහන 05 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලයේ දී, අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමි. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් සඳහා රු.11,869,092 ක් වැය කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.5.2 සැපයීම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා ගර්භයට අවශ්‍ය පුටු සහ මේස මිල දී ගැනීමට අදාළ පිරිවිතර අනුව, මී.මී. 2400x750x750 ප්‍රමාණයේ මේස මිල දී ගත යුතු වුවත්, මේස 06 ක් මී.මී. 2005x605x760 හා මේස 02 ක් මී.මී. 1305x605x760 ක් ලෙස පිරිවිතරවලට පටහැනිව මිල දී ගෙන තිබුණි. මේ සඳහා පුද්ගලික සමාගමකට රු.353,600 ක් ගෙවා තිබුණි. | නිවැරදි පිරිවිතර අනුව මිල දී ගැනීම් සිදු කළ යුතු වේ. | එම ආයතනය සමඟ මෙය නිවැරදි කර ගැනීම පිළිබඳ සාකච්ඡා කර ඇත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 168(i) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය 2019 ජූලි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | අදාළ රීති/ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුර ඉදිරිපත් කර නැත |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කමිටු පැවැත්විය යුතු වේ. | 2018.05.10 හා 2018.08.10 යන දින වලදී විගණන හා කළමනාකරන කමිටු පවත්වා ඇත. |